## උතුරු පළාත් සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 3 ඡේදයේ සිට 6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2006 දෙසැම්බර් 22 දින දෙන ලද නියෝගය පදනම් කරගෙන එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කරන ලදී. 2007 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් සභාව ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, වෙන් කිරීම පිළිබඳව හා උතුරු පළාත් සභාව පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 2012 ජූලි 31 දක්වා ප්‍රසිද්ධ කර නොතිබුණු අතර, පත් වූ උතුරු පළාත් සභාව 2012 ජූලි 31 දක්වා පිහිටුවා නොතිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) පළාත් සභාවේ අරමුදල් ගිණුම්

පළාත් සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් ගිණුම් 2012 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල

2007 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් සභාව සඳහා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලක් ඇති කරන ලදී. එහෙත් අරමුදල ඇති කිරීම පිළිබඳ ව්‍යවස්ථාවලිය පළාත් සභාව විසින් අනුමත කර නොතිබුණි. කෙසේ වුවද, ගරු

ආණ්ඩුකාරතුමා විසින් 2007 ජනවාරි 01 දිනැති අංක 01/2007 දරන ආණ්ඩුකාරවරයාගේ සටහනේ 03 ඡේදය ප්‍රකාරව තම අභිමතය පරිදි ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල ඇති කරන ලදී. පොදු ජන සංවිධානවලින්, සමිතිවලින් ලැබෙන පරිත්‍යාග හා දායක මුදල් සහ භාරගත් ව්‍යාපෘතිවලින් උපයන ලද ආදායමින් ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල සමන්විත විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඉහත මූලාශ්‍රවලින් එවැනි දායක මුදල් ලැබී නොතිබුණු අතර, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඇ) වෙනත් මූල්‍ය ප්‍රකාශන

2012 අප්‍රේල් 30 දිනට සමාලෝචිත වර්ෂය සඳහා වූ අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | මූල්‍ය ප්‍රකාශන වර්ගය | ඉදිරිපත් කළ යුතු මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 2012 අප්‍රේල් 30 දක්වා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 2012 අප්‍රේල් 30 දිනට ඉදිරිපත් නොකරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | විසර්ජන ගිණුම් | 32 | 32 | - |
| (ආ) | ආදායම් ගිණුම් | 06 | - | 06 |
| (ඇ) | පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 32 | 32 | - |
| (ඈ) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු | 04 | 04 | - |
| | | 74 | 68 | 06 |

1.4 **පළාත් සභාව හා පළාත් පාලන ආයතන විසින් වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම**

-

1) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

2) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව උතුරු පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන 34 ක වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

**1.5 වාර්ෂික වාර්තා විගණකාධිපතිවරයාගේ වාර්තා සමඟ පළාත් සභාවේ සභාගත කිරීම**

පත්වූ පළාත් සභාව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව 2007 සිට 2010 දක්වා වූ වර්ෂ සඳහා උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා 2012 ඔක්තෝබර් 06 දින දක්වාත් පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2007 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තාවල පෙන්වා දී තිබුණු අක්‍රමිකතා සම්බන්ධයෙන් කරුණු නිවැරදි කර ගැනීමට පළාත් සභාව විසින් කිසිදු යාන්ත්‍රණයක් අනුගමනය කර නොතිබුණි.

**2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැහැදිලි නොකළ වෙනස්කම්

විගණනයේදී නිරීක්ෂණය වූ පැහැදිලි නොකළ වෙනස්කම් පහත වගුවෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන විෂයයන් | මූල්‍ය | විසර්ජන | වෙනස |
|---|---|---|---|

| | | ප්‍රකාශන අනුව මුදල | ගිණුම් අනුව මුදල | |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | තැන්පතු ගිණුම් | 570,579,237 | 570,600,237 | 21,000 |
| (ii) | පළාත් රාජ්‍ය නිලධාරින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම | 254,199,626 | 224,539,547 | 29,660,079 |
| (iii) | රාජ්‍ය නිලධාරින්ගෙන් ණය සහ අත්තිකාරම් අයකර ගැනීම | 216,686,327 | 262,052,847 | 45,366,520 |

(ආ) ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්

(i) පශු සම්පත් ගොවිපල හා කෘෂිකාර්මික ගොවිපල සහ යාන්ත්‍රික වැඩපල පිළිබඳ අත්තිකාරම් ගිණුම් කටයුතුවල රු.8,904,667 ක් වූ බැර ශේෂයන් ජර්නල් සටහන් මාර්ගයෙන් පළාත් අරමුදල් ගිණුම්වලට මාරු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පළාත් අරමුදල් ගිණුම් රු.8,904,667 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) පළාත් සභාවේ විවිධ මූලාශ්‍රවලින් වූ හිඟ ආදායම් නිශ්චය කර පළාත් අරමුදල් ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 විසර්ජන ගිණුම්වල වූ පොදු අඩුපාඩු

ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ උපයෝජනය නොකිරීම, වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම, හිඟ බැරකම් ගිණුම්වලින් අත්හැරීම්, පුනරාවර්තන වියදම් මූලධන වියදම්වලට අය කිරීම මෙන්ම මූලධන වියදම් පුනරාවර්තන වියදම්වලට අය කිරීම, මූලධන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම, ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් පැහැදිළි කිරීම් නොවීම හා දෙපාර්තමේන්තු පොත්පත් පළාත් භාණ්ඩාගාරයේ පොත්පත් සමඟ නොසැසඳීම වැනි නැවත නැවත සිදු වී තිබුණු පොදු අඩුපාඩුකම් පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාලව සමාලෝචිත වර්ෂයේදීද ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද විසර්ජන ගිණුම්වල පොදු අඩුපාඩු සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියා මාර්ග ප්‍රධාන ලේකම්වරයා විසින් ගෙන නොතිබුණු අතර, කාලීන පදනමින් අදාල ක්‍රියා මාර්ග නොගැනීම නිසා දිගින් දිගටම අක්‍රමිකතා වැඩි වීමට හේතු වී තිබුණි.

මෙම අඩුපාඩුකම්වලට අමතරව, සමාලෝචිත වර්ෂයේ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිබඳ විසර්ජන ගිණුම් විගණනයේදී පහත දැක්වෙන අඩුපාඩුද නිරීක්ෂණය විය.

(අ) සැපයුම්, ඉන්ධන, විදුලිය ආදිය සම්බන්ධයෙන් රු.16,597,536 ක් වූ බැරකම් සඳහා ස්වාධීන සනාථ කිරීම් ලබා ගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 22 ක් විසින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.198,781,457 ක් වූ වියදම් දරා තිබුණු අතර, අතිරික්ත වියදම් දැරීමෙන් පසුව පළාත් මුදල් රීති 46 ප්‍රකාර අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ඇ) පසුගිය වර්ෂවලට අදාලව රු.59,689,555 ක් වූ නිරවුල් නොකළ පාඩු ඊළඟ වර්ෂයට ඉදිරියට ගෙනවිත් නොතිබුණි.

(ඈ) නව වැය විෂය සංකේත ඇති කිරීමෙන් තොරව වියදම් ශීර්ෂ 28 ක් යටතේ වැය විෂය 113 කට අදාලව රු.673,784,106 ක වියදම් දරා තිබුණි.

(ඉ) එකතුව රු.19,340,000 ක් වූ පාඩු සම්බන්ධයෙන් පළාත් මුදල් රීති 61 සිට 74 ප්රකාර කටයුතු කර නොතිබුණු අතර, එය යාපනය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2011 වර්ෂය සඳහා විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

## 2.4 ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වැය ශීර්ෂ 28 ක් යටතේ වැය විෂය 190 ක් සම්බන්ධයෙන් සලසන ලද රු.1,243,674,200 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂය 18 ක් යටතේ ලබා ගත් රු.24,176,817 ක් වූ පරිපූරක ප්‍රතිපාදන අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 2.5 ප්‍රතිපාදන නොමැතිව දරන ලද වියදම්

දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.146,332,726 ක් වූ මූලධන වියදම් ප්‍රතිපාදන නොමැතිව දරන ලද අතර, මෙම වියදම වර්ෂය අවසානයේ අධිභාර ගිණුම මගින් විධිමත් කර තිබුණි.

## 2.6 සාවද්‍ය වර්ගීකරණ

රත්මලාන, සංචාරක බංගලාව වැඩි දියුණු කිරීම සඳහා වූ මූලධන වියදමට අදාලව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු.12,550,825 ක් වූ මූලධන වියදම පුනරාවර්තන වියදම යටතේ සාවද්‍යව වර්ගීකරණය කර තිබුණි. මෙම වියදම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අදාලව නොවූ අතර, එය පළාත් රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවට අයත් වියදමක් විය.

## 2.7 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල වූ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරින්ගෙන් හා විශ්‍රාම ගිය / මිය ගිය, ව්‍යාපෘතිවලට මුදා හරින ලද, සේවය අත්හැර ගිය සහ වැඩ තහනම් කරන ලද නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රැ.7,033,801 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා ක්‍රීඩා පළාත් අමාත්‍යාංශය විසින් රු.1,428,753 ක් වූ හඳුනා නොගත් ශේෂ සහිතව සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

(ඇ) අදල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විධිමත් ගිණුම් පොත්පත් නොපැවැත්වීම හේතුවෙන් නිරවුල් නොකළ ණය සම්බන්ධයෙන් අමාත්‍යාංශ 05 කින් හා දෙපාර්තමේන්තු 27 කින් අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.524,028,312 ක් වූ හර ශේෂයෙන් තථ්‍ය උපලබ්ධි මුදල නිරූපණය වන්නේද යන්න විගණනයේදී නිශ්වය කළ නොහැකි විය.

(ඇ) වර්ෂ 4 කට වැඩි කාලයක් විවිධ සේවක වර්ගයන්ගෙන් ලැබිය යුතු රු.5,928,472 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.8 හිඟ අග්‍රිම ශේෂ නිරවුල් කිරීම

පළාත් දෙපාර්තමේන්තු දෙකක් විසින් එකතුව රු.639,411 ක් වූ අග්‍රිම ශේෂ නිරවුල් නොකර පැවතුණි. මේ සම්බන්ධයෙන් අදාල ආයතනවලින් හිඟ අග්‍රිම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අග්‍රිම ශේෂ පිළිවෙලින් 2012 පෙබරවාරි 29 හා 2012 ජූනි 20 දින නිරවුල් කර තිබුණු බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

**2.9 වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අඩුපාඩු**

පහත සඳහන් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පශු සම්පත් ගොවිපලවල් පවත්වා ගැනීම - විෂය අංක 43202

(i) පුන්තොට්ටම්, වෙක්කාඩිපුලවු හා අච්චුවේලි යන පශු සම්පත් ගොවිපලවල ස්ථාවර වත්කම් වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ii) උතුරු පළාත් සභාවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවල සේවක සංඛ්‍යාව පළාත් සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් තීරණය කර අනුමත කර නොතිබුණි.

(iii) අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අපේක්ෂිත කාරක පාඩු සඳහා පළාත් මූල්‍ය රීති 18.3 ප්‍රකාරව ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iv) පළාත් මුදල් රීති 18.4 ප්‍රකාරව පාඩු පිළිබඳ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) වවුනියා ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපල

සමාලෝචිත වර්ෂයේ බිත්තර රැක්කවීම සඳහා ඉන්කියුබේටරයෙහි තබන ලද බිත්තර 174,173 කින් බිත්තර 125,140 ක් පමණක් එනම්, යෙදවුම්වලින් 72% ක් පමණක් රක්කවා තිබුණි. ඒ අනුව බිත්තර 28% ක් නරක් වී තිබුණි.

(vi) අච්චුවේලි ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපල

සමාලෝචිත වර්ෂයේ බිත්තර රැක්කවීම සඳහා ඉන්කියුබේටරයෙහි තබන ලද බිත්තර 52,916 කින් බිත්තර 36,684 ක් පමණක් එනම්, යෙදවුම්වලින් 69% ක් පමණක් රක්කවා තිබුණි. ඒ අනුව, බිත්තර 31% ක් නරක් වී තිබුණි.

(ආ) රෙදි කර්මාන්ත - විෂය අංක 47302

(i) සමාලෝචිත වර්ෂය සඳහා රු.2,586,162 ක්වූ අවසාන තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට හෙළිදරව් කරනු වෙනුවට විකුණුම් වටිනාකමට හෙළිදරව් කර තිබුණි. තවද, තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) එක් එක් මධ්‍යස්ථානයේ කාර්ය සාධනය තහවුරු කරනු සඳහා එක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් වෙනම ලාභාලාභ ගිණුමක් පිළියෙල කර නොතිබුණි.

(iii) ඩයි වර්ග මිලට ගැනීම හා රෙදි විවීමේ මධ්‍යස්ථාන අතර බෙදා හැරීම සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(iv) මධ්‍යම රජය විසින් හැන්ඩ්ලූම් මධ්‍යස්ථානවලට ලබා දෙන ලද විවීම සඳහා කැටුන නූල් වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි. මධ්‍යම රජයෙන් ලබා දෙන ලද කැටුන නූල් ලැබීම් පිළිබඳව හා ඒවා විවීමේ මධ්‍යස්ථාන අතර බෙදා හැරීම පිළිබඳ විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(ඇ) යන්ත්‍රෝපකරණ ඒකකය - විෂය අංක 46202

(i) එක් එක් මධ්‍යස්ථානයේ කාර්ය සාධනය තහවුරු කර ගැනීමට එක් එක් යන්ත්‍රෝපකරණ මධ්‍යස්ථානය සඳහා වෙනම ලාභාලාභ ගිණුම් පිළියෙල කර නොතිබුණි.

(ii) වර්ෂය අවසානයට අය නොවී පැවතුණු එකතුව රු.4,504,900 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(iii) එකතුව රු.5,684,215 ක් වූ 2011 වර්ෂයේ ශුද්ධ ලාභය පළාත් මුදල් රීති 281(2) ට පටහැනිව දායක මූලධන ගිණුමට ගලපා තිබුණි.

(iv) භෞතික සත්‍යාපන වාර්තා නොමැතිවීමෙන් අත්තිකාරම් ගිණුම් කටයුතුවල වත්කම් තථ්‍ය අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යාවලින් නිරූපණය වන්නේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(v) වටිනාකම රු.150,816,164 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ ක්ෂය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල සිදු කර නොතිබුණි.

## 2.10 ආදායම් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ආදායම් සංකේත 06 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ ආදායම් ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පළාත් සභාවේ ව්‍යවස්ථාවලින් අනුමත නොවීම හේතුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනය ප්‍රකාර රජයේ නිල නිවාස මත කුලී, අත්තිකාරම් ගිණුම් මත පොලී, වාහන බලපත්‍ර ගාස්තු සහ මුද්දර ගාස්තු ආදී ආදායම් එකතුව රු.1,312,766,180 ක් පළාත් සභාවේ පළාත් අරමුදලට ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.11 බැංකු සැසඳුම් ප්‍රකාශ

ඇතැම් පළාත් සභා ආයතනවල බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන ගැලපීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මාස 6 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ රු.20,000 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු සම්බන්ධයෙන් බැංකුවෙන් විමසීම් කර පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) මාස 6 කට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද රු.17,208,609 ක් වටිනාකම වූ චෙක්පත් 180 ක් සම්බන්ධයෙන් පළාත් මුදල් රීති 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) යාපනය, මුලතිව් හා වවුනියා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ දෙපාර්තමේන්තුවේ එක් බැංකු ගිණුමක රු.10,595 ක් හා රු.448,646 ක් වූ පිළිවෙලින් හඳුනා නොගත් හර හා බැර නිරීක්ෂණය විය. කෙසේ වුවද, මෙම හර හා බැර හඳුනාගෙන අදාල ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

## 2.12 පොදු තැන්පතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව එක් එක් මාස 6 ක් අවසානයේ කල් ඉකුත් වූ තැන්පතු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගිණුම්වල වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවා පැවති රු.2,811,477 ක් වූ තැන්පතු ශේෂ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ වටිනාකම රු.8,481,261 ක් වූ සාමාන්‍ය තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ හැකිව තිබූ නමුත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) මුද්දර ගාස්තු, දායක විශ්‍රාම අරමුදල්, ණය අයකර ගැනීම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල සඳහා දායකය සහ රඳවා ගැනීම් බදු ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.871,558 ක මුදලක් අදාල ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(ඉ) පෙර වර්ෂය තුළ වැය නොකළ මූලධන ප්‍රතිපාදන ලෙස රු.88,515,197 ක මුදලක් තැන්පතු ගිණුම්වලට මාරු කර තිබුණද, මෙම මුදල අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයේ මූලධන වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.344,446 ක වටිනාකමට ලියන ලද චෙක්පතක් පසුව අවලංගු කර අදාල ගැලපීම් කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(උ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රු.62,032,964 ක් වූ හඳුනා නොගත් ශේෂයන් සමඟ තැන්පතු ගිණුම් පිළියෙල කර තිබුණි.

(ඌ) එකතුව රු.17,329,188 ක් වූ ව්‍යාපෘති 5 කට අදාල අරමුදල් අදහස් කළ කාරණයන්ට යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(එ) පළාත් භාණ්ඩාගාරය, පළාත් අමාත්‍යාංශ හා අණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය ඇතුළු දෙපාර්තමේන්තු 15 ක් විසින් විවිධ කාරණයන් සඳහා ලද එකතුව රු.284,225,659 ක් වූ අරමුදල් අදහස් කළ කාරණයන්ට යොදා ගැනීමෙන් තොරව වර්ෂ දෙකකට වැඩි කාලයක් තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(ඒ) ආහාර හා කෘෂිකර්ම සංවිධාන ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් විසින් ගොවීන් සඳහා නොමිලේ පරිත්‍යාග කරන ලද යතුරු පැදි කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සහන මිලකට නිලධාරින්ට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් යතුරු පැදි ප්‍රතිලාභීන්ගෙන් අය කරන ලද රු. මිලියන 71.4 ක අය කිරීම් පළාත් ආදායමට බැර කිරීමෙන් තොව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

## 2.13 විගණනය සඳහා සාක්ෂි නොවීම

(i) බිල්පත්, ලදුපත්, ඉල්ලීම්, සනාථ කිරීම්, භාණ්ඩ ලැබීම් පත්, භාණ්ඩ නිකුත් කිරීම් පත්, වැඩ නිම කිරීම් සහතික ආදී අවශ්‍ය සාක්ෂි නොවීම හේතුවෙන් පළාත් ආයතන 18 කට අදාල ගිණුම්වල දැක්වෙන එකතුව රු.141,838,732 ක් වූ විෂයයන් 246 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) රු.1,058,657 ක් වූ විවිධ තැන්පතු ශේෂය ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැතිව ජර්නල් සටහන් මාර්ගයෙන් පළාත් අරමුදල් ගිණුමට මාරු කර තිබුණි.

## 2.14 විගණනයට තොරතුරු ඉදිරිපත් කිරීම

(i) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව ලේකම්වරුන් කිහිප දෙනෙකුට යාපනයේ නිවාස අයත්ව තිබූ නමුත් පළාත් සභාව විසින් නිවාස කුලියට ගෙන, ලේකම්වරුන්ට ලබා දී තිබුණි. එම නිවාස සඳහා කුලී, විදුලි ගාස්තු, ජල බිල්පත් ආදිය පළාත් අරමුදලින් ගෙවීම පිළිබඳ විස්තර විගණනය සඳහා ඉල්ලා සිටි නමුත් මුදල් රෙගුලාසි 122 ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී. පළාත් සභාවට අයත් වාහන කිහිපයක් අනතුරුවලට ලක් වී තිබුණද, ඒ පිළිබඳ විස්තර විගණනයට ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා සේවක සංඛ්‍යා අවශ්‍යතාවය, බඳවා ගැනීම් පරිපාටිය, වයස් සීමා, අධ්‍යාපන සුදුසුකම් ආදිය සලකා බැලීමෙන් තොරව පත්වීම් ලබා දී තිබුණද, එම පත්වීම් පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iv) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර විගණනය සඳහා ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2.15 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පළාත් මුදල් රීති

අංක 47(1), 51, 70, 69, 70(5) 76, 105, 106, 107, 166(3), 172, 220(1), 236(3), 237, 260(iii), 261, 301, 365(1), 367, 368, 403, 407, 415(1), 420(1) (v) (xiii) , 433, 434(2), 434(5), 434(6)

(ආ) 1988 අගෝස්තු 14 දිනැති අංක 361 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

## 2.16 මධ්‍යම රජයේ ප්‍රතිපත්තිවලට පටහැනිව ආයතනික කරුණු ක්‍රියාත්මක කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1999 ජූනි 01 දිනැති අංක පීඩී/බීපී/9 දරන චක්‍රලේඛයට අනුව, පළාත් රාජ්‍ය සේවා නිලධාරින්ගේ ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු පිළිබඳ පරිපාටිවලට අනුකූල විය යුතුය. එම විධිවිධානවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(i) එක් ලේකම්වරයකුට රු.150,000 (ආසන්න වශයෙන්) බැගින් වටිනාකම ඇති ගෘහ භාණ්ඩ සහිතව සම්පූර්ණයෙන් සකස් කරන ලද නිවාස කුලියට ලබා ගෙන පදිංචි වූ ලේකම්වරුන්ගෙන් නිවාස කුලී අයකරගෙන නොතිබූ අතර, එම ලේකම්වරුන් පදිංචි වී සිටි නිවාස සඳහා විදුලි ගාස්තු, ජල බිල්පත් පළාත් අරමුදලින් ගෙවා තිබුණි. රජයේ නිල නිවාසවල පදිංචිය සඳහා ලේකම්වරුන් ඇතුළු සියළුම නිලධාරින්ගෙන් නිවාස කුලී හා ඔවුන් විසින් නිරවුල් කළ යුතු ජල බිල්පත් හා විදුලි ගාස්තු අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3 වගන්තිය ප්‍රකාරව හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එවකට උතුරු නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් අමතන ලද 2001 අගෝස්තු 06 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. පළාත් සභාව ක්‍රියාත්මක නොවීම නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතිය මධ්‍යම රජයේ හා අනෙකුත් පළාත් සභාවල සමාන සේවා සඳහා වන පහසුකම් හා වරප්‍රසාද එම ලේකම්වරුන්ටද ලබා දී ඇති බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයා දන්වා තිබුණි.

(ii) විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2011 ජනවාරි සිට පළාත් සභාව විසින් ගොඩනැගිලි 14 ක් කාර්යාල කටයුතු සඳහා කුලියට ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා කුලී ලෙස රු.7,467,252 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් කුලී ගෙවීම පිළිබඳ තක්සේරුවක් ලබා ගෙන නොතිබුණි.

(iii) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරන ලද සේවකයන්ට වැටුප් ලෙස රු. මිලියන 9,707 ක මුදලක් ගෙවා තිබුණි.

(iv) ප්‍රාදේශීය කොමසාරිස් සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යාව අනුමත කර නොතිබුණද, නැවත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන නිලධාරින් කිලිනොච්චි, යාපනය හා වවුනියා ප්‍රාදේශීය කොමසාරිස්වරු ලෙස කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. 2011 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට පටහැනිව වැටුප් ලෙස රු. මිලියන 1.5 ක මුදලක් වාහන නඩත්තුව, ඉන්ධන, සහ අනෙකුත් කාර්යාල නඩත්තු වියදම්වලට අමතරව ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.721,712,394 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.47,201,940 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.768,914,334 ක වර්ධනයක් දැක්වුණි. බදු නොවන ආදායම හා රජයේ ප්‍රදාන රු.9,775,312,049 කින් වැඩිවීම එයට හේතු වී තිබුණි.

## 3.2 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **ආදායම් විෂයයන්** | | | | | | |
| බදු හා බදු නොවන ආදායම | 42 | 1,312.80 | (1,270.80) | 35.23 | 155.19 | (119.96) |
| රජයේ ප්‍රදාන | 11,717.20 | 10,870.70 | 846.50 | 11,757.17 | 11,320.21 | 436.96 |
| | 11,759.20 | 12,183.50 | 424.30 | 11,792.40 | 11,475.40 | 317.00 |

වියදම

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 7,606 | 7,583 | 23 | 6,800.16 | 6,783.02 | 17.14 |
| අනෙකුත් | 2,162 | 2,124 | 38 | 1,899.84 | 1,893.20 | 6.64 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උප එකතුව | 9,768 | 9,707 | 61 | 8,700.00 | 8,696.22 | 23.78 |
| මූලධන වියදම | 1,949 | 1,754 | 195 | 3,057.17 | 2,846.20 | 210.97 |
| මුළු එකතුව | 11,717 | 11,461 | 256 | 11,757.17 | 11,522.42 | 234.75 |

## 3.3 මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු. මිලියන 11,461 ක් විය. එයින් 84.6% කින් පුනරාවර්තන වියදම නියෝජනය වූ අතර, 15.4% කින් මූලධන වියදම නියෝජනය විය. තවද, මුළු වියදමින් රු. මිලියන 7,583 ක් එනම්, 66% ක් පෞද්ගලික පඩිනඩි සඳහා දරා තිබුණි.

(ආ) මෝටර් වාහන ආදායම් බලපත්‍ර යටතේ හිඟ ආදායම් නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 3.4 පළාත් අරමුදල් උපයෝජනය

පළාත් සභාවේ සංවර්ධන වැඩ සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් හා ඒ මත දරන ලද තථ්‍ය වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විෂයය විස්තරය | ලැබුණු අරමුදල් | තථ්‍ය වියදම | ඉතිරිවීම් | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,150,000,000 | 1,040,120,034 | 109,879,966 | 90 |
| (ii) | අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය (ESDP) | 80,500,000 | 58,876,300 | 21,623,700 | 73 |
| (iii) | උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (NRCP) | 700,000,000 | 481,626,472 | 218,373,528 | 69 |
| (iv) | එක්සත් ජාතීන්ග් ළමා අරමුදල (UNICEF) | 309,000,000 | 305,353,651 | 3,646,349 | 99 |
| (v) | පළාත් මාර්ග ව්‍යාපෘතිය (PRP) | 654,000,000 | 234,089,574 | 419,910,426 | 36 |
| (vi) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 344,319,000 | 276,250,000 | 68,069,000 | 80 |
| (vii) | දිළිඳු හිතකාමී ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති / එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) | 45,000,000 | 2,027,680 | 42,972,320 | 04 |
| (viii) | ගැලපුම් ප්‍රදාන | 30,000,000 | 27,000,000 | 3,000,000 | 90 |
| (ix) | නවෝදය උතුරු පළාත් සභාව | 100,000,000 | - | 100,000,000 | 00 |
| | | 3,412,819,000 | 2,425,343,711 | 987,475,289 | 71 |

## 3.5 පළාත් අරමුදල්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා බැංකු ශේෂ රු. මිලියන 400 සිට රු. මිලියන 1,775 දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණු අතර, මෙම කරුණ මාගේ පෙර වර්ෂවල විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, පළාතේ පොදු ජනතාවගේ ප්‍රතිලාභ සඳහා මෙම මුදල් උපයෝජනය කිරීමට 2012 ජූනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2011 දෙසැම්බර් 31 දින ලියන ලද රු.15,188,932 ක් වටිනාකම වූ චෙක්පත් 217 ක් 2012 මාර්තු 31 දක්වා බැංකුවලට ඉදිරිපත් කර නොතිබුණු අතර, එම මුදල් අදාල බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ තථ්‍ය වියදම උතුරු පළාත් සභාවේ විසර්ජන ගිණුම්වල (ශීර්ෂ 315 යටතේ) එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ රු. මිලියන 5 ක බැංකු ශේෂයක් කිසිදු ගනුදෙනුවකට යොදා ගැනීමෙන් තොරව 2008 වර්ෂයේ සිට වර්ෂ 4 ක කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමේ අරමුණු කළ කාර්යය ඉටු කර ගෙන නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### 3.6.1 අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

උතුරු පළාත් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට යෝජිත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පාසැල් හැර අනෙකුත් ආයතන

| වර්ගය | යෝජිත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 1,173 | 630 | 460 |
| සහාය කාර්ය මණ්ඩලය හා කණිෂ්ඨ ශ්‍රේණි | 26,047 | 23,851 | 2,196 |
| අනෙකුත් (අනියම් / තාවකාලික) | 1,109 | 696 | 413 |
| | 28,329 | 25,177 | 3,069 |

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික නිලධාරින් හා ප්‍රාදේශීය කොමසාරිස්වරුන් බඳවා ගැනීම අනුමත කර නොතිබුණද, උතුරු පළාත් සභාව විසින් එම තනතුරු සඳහා පත් කිරීම් සිදු කර තිබුණු අතර, දළ වශයෙන් රු.861,540 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් ලෙස ගෙවා තිබුණි.

### 3.6.2 අවිධිමත් පත් කිරීම් හා පාරිශ්‍රමික

පළාත් සභාවේ බඳවා ගැනීම් වැඩි ප්‍රමාණයක් කිසිදු විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව තත්කාර්ය පදනම මත සිදු කර තිබූ අතර, පත් කිරීම් කිහිපයක් දීප ව්‍යාප්ත සේවා හෝ පළාත් රාජ්‍ය සේවයෙහි අනුමත බඳවා ගැනීම් පරිපාටි විෂය සීමාව තුළට නොගැනෙන පත් කිරීම් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නැවත සේවයෙහි යොදවන ලද විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ට වැටුප් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් රු. මිලියන 3.36 ක මුදලක්, හිමි වැටුප් ප්‍රමාණයට වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි නොවන නිලධාරින් 4 දෙනෙකු පත්කර තිබුණි.

(ඇ) නීති උපදේශක ඇතුළු කොන්ත්‍රාත් පදනම මත වූ සේවකයන් 9 දෙනෙකුට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පත්වීම් ලිපි නිකුත් කර තිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 වගන්තිය ප්‍රකාරව විධිමත් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව විශ්‍රාමික නිලධාරින් කිහිප දෙනෙකු පත් කර තිබුණි.

(ඉ) පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරුන් සිටියදී, බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කණිෂ්ඨ ගණකාධිකාරීවරුන් ප්‍රධාන ගණකාධිකාරිවරු ලෙස පත්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස යහපත් මූල්‍ය පාලනය හා විනය එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රධාන කළමනාකරණ ලිපිකරුවන් ලෙස කළමනාකරණ සේවයේ I පන්තිය වෙනුවට කළමනාකරණ සේවයේ III පන්තියෙන් පත් කර තිබුණි.

(උ) බොහෝ කළමනාකරණ සහකරු කාර්යයන් වැඩසටහන් සහකාරවරුන්ට පවරා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය දීප ව්‍යාප්ත සේවයක් වුවද, 2007 පෙබරවාරි 11 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය නොසලකා හරිමින් නිලධාරින් 25 දෙනෙකු ගණකාධිකාරීවරුන්ගේ කාර්යයන් සිදු කිරීම සඳහා පත්කර තිබුණි.

## 3.7 පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිබඳ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ උතුරු පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.7.1 ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ගරු ආණ්ඩුකාරතුමාගේ ලේකම් කාරයාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් රු. මිලියන 61.8 ක පිරිවැයකට යාපනයේ ඉදිකර, නිමකර තිබුණද, යාපනයේ සහ කොළඹ ක්‍රියාත්මක වන කාර්යාල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.1,440,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඉහත ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු. මිලියන 61.8 ක මුදලක් වැය කිරීමට මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) මායිම් තාප්පය, වාහන ගාල් කරන ස්ථානය, ළිඳ, ආරක්ෂක කුටිය, සම්ප් එක (Sump), ජල ටැංකිය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව රු. මිලියන 4 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි.

(ඈ) මුල් ඇස්තමේන්තු පිරිවැය 22% සිට 156% දක්වා ඉක්මවූ විචලනයන් සඳහා රු. මිලියන 13.3 ක් අදාල බලධාරින්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි.

(ඉ) ලී බඩු හා උපකරණ සඳහා මුල් පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 3 ක් වුවද, විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව රු. මිලියන 7 කට විෂයයන් ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඊ) වාහන ගාල් කරන ස්ථානය, ළිඳ, ආරක්ෂක කුටිය, සම්ප් එක (sump) සහ ජල ටැංකිය ඉදි කිරීම සඳහා ප්‍රමාණ පත්‍රයේ රු.446,000 ක වටිනාකමට දැක්වෙන විෂයයන් 19 ක් සඳහා තාක්ෂණික නිලධාරියා විසින් කිසිදු වලංගු හේතුවක් නොමැතිව කොන්ත්‍රාත්කරු විසින් බිල්පත්‍රයේ ඉල්ලීම් කරන ලද ප්‍රමාණයට වඩා වැඩි කර තිබුණි.

**3.7.2 ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම - රු.7,006,470**

සමාලෝචිත වර්ෂය තුළදී ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට ලී බඩු සහ කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු.7,006,430 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනුදෙනු ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අදාල වුවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් ගෙවීම කර තිබුණි.

(ආ) ගෙවීම් සඳහා මුල් ඉන්වොයිසි ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වවුචර් සමග ඉන්වෙන්ටරි සහතික නොමැතිව ගෙවීම් කර තිබුණි.

**3.7.3 පළාත් භාණ්ඩාගාරය**

පළාත් භාණ්ඩාගාරය විසින් 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 01 වගන්තිය ප්‍රකාරව එකතු කළ අගය මත බදු සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල වෙනම ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින් පළාත් සභාවේ විවිධ ආයතන විසින් බාහිර පාර්ශ්වයන් සඳහා ගෙවන ලද එකතු කළ අගය මත බදු ගණනය කිරීමට පළාත් සභාවට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පළාත් සභාව විසින් වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව මූලධන ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු මුදලක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවා තිබුණි.

**3.7.4 අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය**

මූලධන වත්කම් මිලදී ගැනීමට අදාලව 2011 දෙසැම්බර් 31 දින රු.1,412,146 ක මුදලකට ලියන ලද චෙක්පත් 18 ක් 2012 මාර්තු 31 දක්වා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. 2012 මාර්තු 31 දක්වා මෙම මිලදී ගැනීම් සම්පූර්ණ කර නොතිබුණි.

**3.7.5 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය**

(අ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාසැල් අතර පෙළ පොත් , නිල ඇඳුම් හා ලී බඩු අසමානව බෙදා හැර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) රු.128,000 සිට රු.600,000 ක පරාසයක වූ උප අග්‍රිම පළාත් මුදල් රීති 219.2 (ii) ට පටහැනිව මාණ්ඩලික නොවන ශ්‍රේණිවල නිලධාරීන් ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකුට ගෙවා තිබුණි.

(ඇ) ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව ගෙවීම් සිදු කිරීම නිසා විවිධ කාර්යයන් සඳහා විවිධ නිලධාරීන්ට ගෙවා තිබූ අත්තිකාරම් නිරවුල් කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(ඈ) සහභාගී වූ සංඛ්‍යාවට වැඩියෙන් ආහාර පාන ඉහළ මිලකට සැපයීම නිසා පළාත් අධ්‍යාපන දෙපර්තමේන්තුව විසින් දරන ලද එකතුව රු.2,634,297 ක් වූ පහත දැක්වෙන වියදම් අනාර්ථික ගනුදෙනු ලෙස සැලකිය හැක.

| වියදම් පිළිබඳ විස්තරය | රු. |
|---|---|
| සංගීත වැඩසටහන සඳහා ආහාර පාන සැපයීම | 837,185 |
| දීපවාලී ඇතුළත් විශේෂ දිනයන් සඳහා තෑගි පිරිනැමීම | 854,250 |
| කොළඹ සංස්කෘතික වැඩසටහන පැවැත්වීම | 139,452 |
| පෙර පාසැල් සඳහා ආහාරපාන වියදම් | 421,410 |
| මන්නාරම පැවති දෙමළ වැඩසටහන සඳහා අලෝකකරණය සහ ශබ්ද විකාශන | 382,000 |
| | 2,634,297 |

(ඉ) ආසියා පදනම විසින් පරිත්‍යාග කරන ලද වටිනා පොත් අවශ්‍ය පාසැල්වලට බෙදා හැරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 1 කට වැඩි කාලයක් ගබඩාවේ තබා තිබුණි.

(ඊ) ගුරුවරුන් අවිධිමත්ව යෙදවීම

(i) අදාළ විෂයයන් සඳහා පාසැල්වල තිබෙන පුරප්පාඩු අනුව ගුරුවරුන් විධිමත්ව යොදවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අදාල විෂයයන් සඳහා පාසැල් කිහිපයක ගුරු හිඟයක් නිරීක්ෂණය වූ අතර, එම විෂයයන් සඳහාම පාසැල් කිහිපයක ගුරු අතිරික්තයක් නිරීක්ෂණය විය. ගුරුවරුන් අවිධිමත්ව යෙදවීම

හේතුවෙන් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගයන්හි කාර්ය සාධනය ළඟා කරගෙන නොතිබුණි. විෂයයන් සඳහා ඇති පුරප්පාඩු අනුව ගුරුවරුන් යෙදවීම සිදු කළේ නම් යහපත් කාර්ය සාධනයක් ළඟා කරගත හැකිව තිබුණි.

(ii) ගුණාත්මක යෙදවුම් සඳහා කලාප අධ්‍යාපන කාර්යාල 12 ක පාසැල් 1,016 කට රු.84,750,000 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වුවද, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගුණාත්මක යෙදවුම් යටතේ වෙන් කරන ලද අරමුදල් පිළිබඳ විධිමත් අධීක්ෂණයක් හා පාලනයක් නොවූ බැවින් රු.3,498,263 ක මුදලක් අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව රඳවාගෙන තිබුණි. පාසැල්වලට මුදා හරින ලද රු.81,251,737 ක අරමුදල්වලින් සැලකිය යුතු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී පාසැල් කිහිපයක් විසින් උපයෝජනය කර නොතිබූ බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(උ) අධ්‍යාපන අංශ සංවර්ධන අරමුදල් උපයෝජනය

(i) කිලිනොච්චි සෙන්ට්‍රල් විද්‍යාලයේ ඩිජිටල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම - රු.2,097,847

(අ) වැඩ කිහිපයක් නිම කිරීමෙන් තොරව ඉහත කාර්යය සඳහා අවසාන ගෙවීම් සිදු කර තිබුණි.

(ආ) වහලය හා දොර රාමු වැඩ ඇතුළත් වැඩ බොහොමයක් විධිමත්ව සිදු කර නොතිබුණි.

(ඇ) 2011 නොවැම්බර් 29 දින කිලිනොච්චි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඩිජිටල් පුස්තකාලය සඳහා නිකුත් කරන ලද ලීබඩු 87 ක් හා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඈ) ඩිජිටල් පුස්තකාලය සඳහා පරිගණක භාර දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පුස්තකාලය සඳහා රු.2,097,847 ක වටිනාකම වූ ගොඩනැගිල්ල සහ රු.1,254,080 ක් වටිනාකම වූ උපකරණ ව්‍යාපෘතියෙන් අදහස් කළ කාරණයන් සඳහා සේවා සපයා නොතිබුණි.

(ii) යා/කරෙයිනගර් Dr.ත්‍යාගරාජා මධ්‍ය මහා විද්‍යාලයෙහි ඩිජිටල් පුස්තකාලය ඉදි කිරීම - රු.2,297,857

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජූලි 20 දින ඩිජිටල් පුස්තකාලය විවෘත කර තිබුණද, 2012 දෙසැම්බර් 31 දක්වා පුස්තකාලය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) විදුලි සම්බන්ධතාවය 2012 අප්‍රේල් 30 දක්වා සලසා නොතිබුණි.

(ඇ) පුස්තකාලයට ස්ටීල් ගෘහ භාණ්ඩ නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබුණද, දැව ගෘහ භාණ්ඩ නිකුත් කර තිබුණි.

(ඈ) ඩිජිටල් පුස්තකාලය සඳහා පරිගණක නිකුත් කර නොතිබුණි. ඒ අනුව, පුස්තකාලය සඳහා වැය කළ රු.2,056,498 ක් වූ ගොඩනැගිල්ලේ වටිනාකමින් හා රු.1,254,080 ක් වූ ලී බඩු හා උපකරණ වටිනාකමින් ව්‍යාපෘතිය අදහස් කළ කාරණයන් සඳහා සේවයක් සැලසී නොතිබුණි.

### 3.7.6 ක්‍රීඩා දෙපාර්තමේන්තුව

ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් රු.447,180 කට මිලට ගෙන තිබූ ක්‍රීඩා කට්ටල අදහස් කළ කාරණයන්ට යොදා ගෙන නොතිබුණි.

### 3.7.7 කර්මාන්ත දෙපාර්තමේන්තුව

(i) ව්‍යවසාය සංවර්ධන සේවා මධ්‍යස්ථානය සඳහා රු.5,500,000 ක මූලධන ප්‍රතිපාදනයක් සලසා තිබුණද, අරමුණුවල ප්‍රගතිය ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමයක් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සුළු ණය සඳහා රු.500,000 ක මූලධන ප්‍රතිපාදනයක් සලසා තිබුණද, සුළු ණය කාර්යයන් ක්‍රියාත්මක කිරීමට මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන නොතිබුණි.

(iii) ගොඩනැගිලි හා ව්‍යුහයන්, ජලාශ හා මාර්ග සඳහා රු.4,500,000 ක මූලධන ප්‍රතිපාදනයක් සලසා තිබුණද, අදහස් කළ කාරණයන් සඳහා මෙම අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

### 3.7.8. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

(i) ජීවනෝපාය ණය කළමනාකරණ ක්‍රමය සඳහා පළාත් මධ්‍යස්ථානයට රු. මිලියන 21.6 ක මූලධන ප්‍රතිපාදනයක් සලසා තිබුණද, අරමුණුවල ප්‍රගතිය ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමයක් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සුළු ණය කාර්යයන් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව රු. මිලියන 20 ක මුදලක් උපයෝජනය කර තිබුණි. තවද, සුළු ණය කාර්යයන් සඳහා පළාත් අරමුදල් උපයෝජනය කර ගැනීමට අනුමැතිය මුදල් කොමිෂන් සභාවෙන් ලබා ගෙන නොතිබුණු බවද, නිරීක්ෂණය විය.

## 3.7.9 සෞඛ්‍ය අමාත්‍යාංශය

2010 වර්ෂය තුළදී සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරකට පත් වී තිබූ අතර, රු.795,000 ක මුදලක් වාහනය අළුත්වැඩියා කිරීම සඳහා වැය කර තිබුණි. එහෙත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 1994 සැප්තැම්බර් 12 දිනැති අංක එම්එෆ්/පී/වීඊඑච්/1 දරන චක්‍ර ලේඛය ප්‍රකාරව 2010 වර්ෂය සඳහා මෙම වාහනය අමාත්‍යාංශය විසින් රක්ෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අළුත්වැඩියා ගාස්තුවලින් කොටසක් රක්ෂණයෙන් ලබා ගැනීමේ අවස්ථාව පළාත් සභාව විසින් අහිමි කරගෙන තිබුණි. මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද මෙම කාරණය පෙන්වා දී ඇති නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.7.10 දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

(i) මහජනයාට සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන නිදහස් ආයුර්වේද ඖසුසල් 84 ක් නිසි අධීක්ෂණයක් හා ප්‍රමාණවත් ඖෂධ නොමැතිව ක්‍රියාත්මකව තිබුණි.

(ii) දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව ආයුර්වේද ඖෂධ සංවර්ධනය කිරීමට හා වියළි පැළෑටි රැස් කරන සථානයක් (Herbarium) පිහිටුවීම හා නඩත්තු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද, පෞද්ගලික වෙළඳුන්ගෙන් හා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ඖෂධ මිලදී ගැනීමට විශාල මුදලක් වැය කර තිබුණි.

## 3.7.11 සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(අ) වෛද්‍යවරුන් හා සහාය කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් රෝහල් කිහිපයක ගොඩනැගිලි හා වෛද්‍ය උපකරණ බොහොමයක් නිෂ්කාර්යව තිබුණි. එබැවින් මෙම ගොඩනැගිලි හා උපකරණ සඳහා දරන ලද වියදම් ඵල රහිත බවට සැලකිය හැකි අතර, මෙම වියදම්වල ප්‍රතිලාභය පොදු ජනතාව කරා ළඟා වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | ආයතන සංඛ්‍යාව | ලබා ගත හැකි වූ වෛද්‍යවරුන් සංඛ්‍යාව | අනුමත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| යාපනය | 42 | 30 | 99 |
| මුලතිව් | 09 | 18 | 55 |
| කිලිනොච්චි | 13 | 22 | 62 |
| මන්නාරම | 16 | 44 | 89 |
| වවුනියා | 11 | 108 | 94 |
| | 91 | 222 | 399 |

(ආ) උතුරු පළාතේ රෝහල් සංඛ්‍යාව 61 ක් වුවද, දන්ත ඒකක සඳහා අනුමත කාර්ය මණ්ඩලය 27 ක් පමණක් හෙයින් දන්ත ඒකක සඳහා කාර්ය මණ්ඩලය වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | රෝහල් සංඛ්‍යාව | ලබා ගත හැකි දන්ත වෛද්‍යවරු සංඛ්‍යාව | අනුමත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| යාපනය | 26 | 18 | 09 |
| මුලතිව් | 06 | 05 | 03 |
| කිලිනොච්චි | 09 | 05 | 04 |
| මන්නාරම | 10 | 08 | 04 |
| වවුනියා | 10 | 10 | 07 |
| | 61 | 46 | 27 |

(ඇ) මන්නාරම, කිලිනොච්චි, මුලතිව් හා යාපනය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශවල එක් එක් රෝහල් සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකු සිටිය යුතුය. කෙසේ වුවද, උතුරු පළාතේ රෝහල් සඳහා අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් 51 දෙනෙකුගෙන් 2011 දෙසැම්බර් 31 දිනට විශේෂඥ වෛද්‍යවරුන් 11 ක් පමණක් සේවයේ යෙදී තිබුණි.

(ඈ) උතුරු පළාතේ පාසැල් 1011 ක් ක්‍රියාත්මක වුවද, උතුරු පළාත් පාසැල්වල දන්ත ඒකක 15 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි.

**3.7.11.1 යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තෙලිප්පලෙයි මූලික රෝහලේ වාට්ටු සහ නිල නිවාසවල නවීකරණ කටයුතු - රු.9,483,051

(i) වැඩ විෂයන් 19 ක එකතුව රු.795,590 ක් වූ ප්‍රමාණපත්‍ර තාක්ෂණික නිලධාරියා විසින් කිසිදු හේතුවක් නොදකවා වැඩි කර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල බලධාරීන්ගෙන් විධිමත් අනුමැතියක් ප්‍රමාණ පත්‍ර විෂයයන් වැඩි කිරීම සඳහා ලබාගෙන නොතිබුණි.

(ii) අදාල බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අතිරේක වැඩ ප්‍රමාණයන් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුට රු.1,219,370 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගෙවීම් පිළිබඳ අවසාන බිල්පත්‍ර පරීක්ෂා කිරීමෙන් තොරව ගෙවීම් කිරීම

ප්‍රමාණ පත්‍ර සමඟ විෂයයන්හි ප්‍රමාණයන්, මිනුම් හා මිල පරීක්ෂා කිරීමෙන් තොරව පහත දැක්වෙන කොන්ත්‍රාත් ගෙවීම් සිදු කර තිබුණි.

| | වැඩෙහි ස්වභාවය | ගෙවූ මුදල |
|---|---|---|
| | | රු. |
| (i) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පන්නායි හි ඉදි කිරීම - අදියර I | 3,928,972 |
| (ii) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පන්නායි | 1,422,305 |

හි ඉදි කිරීම - අදියර II

(iii) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පන්නායි හි ඉදි කිරීම - අදියර III — 1,531,421

-------------

6,882,698

========

(ඇ) එකතු කළ අගය මත බදු ගෙවීම (වැට්) රු.19,715,882

එකතුව රු.19,715,882 ක්වූ එකතු කළ අගය මත බදු විවිධ කොන්ත්‍රාත්කරුවන්ට හා සැපයුම්කරුවන්ට සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එහෙත්, එකතු කළ අගය මත බදු ගෙවීම පිළිබඳ මාසික ප්‍රකාශන 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ඊළඟ මාසයේ 15 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට යවා නොතිබුණි.

(ඈ) ආහාර වේල් සඳහා ගෙවීම් කිරීම

(i) භාග ආහාර වේලක් සඳහා ගෙවීම සම්පූර්ණ ආහාර වේලක් ලෙස ගෙවා තිබුණි. සම්පූර්ණ ආහාර වේලක හා භාගයකට අදාල වන රේටයන් විශ්ලේෂණය කිරීමෙන් තොරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් රේටයන් අනුමත කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | කරවෙඩ්ඩි | | කොන්ඩාවිල් | | අනලයිතිව් | | නයිනතිව් | | වෙලනෙයි | | මනිපායි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය | සම්පූර්ණ ආහාර වේලක රේටය | භාග ආහාර වේලක රේටය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අළුත් මාළු | 98 | 134 | 100 | 150 | 120 | 127 | 75 | 140 | 100 | 135 | 90 | 120 |
| හරක් මස් | 98 | 135 | 110 | 150 | 120 | 127 | 75 | 140 | - | - | 90 | 120 |
| කරවල | 98 | 135 | 110 | 150 | 120 | 127 | 75 | 140 | 100 | 135 | 90 | 120 |
| එළවළු | 90 | 120 | - | - | 110 | 112 | 75 | 130 | 100 | 110 | - | - |
| බිත්තර | 98 | 117 | 100 | 150 | 120 | 127 | 75 | 140 | - | - | 90 | 120 |

(ii) පහත දැක්වෙන රෝහල්වල සම්පූර්ණ හා භාග ආහාර වේලක රේටයන් කොන්ත්‍රාත්කරුවන් විසින් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව රේටයන් විශ්ලේෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | ගුරුනගර්හි සම්පූර්ණ හා භාග ආහාර වේලක රේටය | පන්ඩතරිප්පු සම්පූර්ණ හා භාග ආහාර වේලක රේටය | අලවෙඩ්ඩි සම්පූර්ණ හා භාග ආහාර වේලක රේටය | පුන්කුඩුතිව් සම්පූර්ණ හා භාග ආහාර වේලක රේටය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| අළුත් මාළු | 120 | - | 140 | 130 |
| හරක් මස් | - | - | 140 | 130 |
| කරවල | 120 | 125 | - | - |
| එළවළු | 50 | - | - | 120 |
| බිත්තර | 120 | 100 | - | 130 |

(iii) ආහාර වට්ටෝරු වර්ග 5 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු විසින් එකම රේටයන් ඉදිරිපත් කර තිබුණි. ආහාර වට්ටෝරු විවිධ වර්ගයන් සඳහා එකම රේටයන්ට ගෙවීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

ප්‍රාදේශීය රෝහල, කොඩිකාමම්

| විස්තරය | සම්පූර්ණ ආහාර වේලක් සඳහා රේටය | ආහාර භාග වේලක් සඳහා රේටය |
|---|---|---|
| | රු. | රු. |
| මාළු සහිත | 135 | 50 |
| හරක් මස් සහිත | 135 | 50 |
| කරවල සහිත | 135 | 50 |
| එළවළු සහිත | 135 | 50 |
| බිත්තර සහිත | 135 | 50 |

(iv) ප්‍රමාණවත් අළුත් මාළු ලබා ගත හැකි වන ඩෙල්ෆ්ට් ප්‍රාෙද්ශීය රෝහලේ කොන්ත්‍රාත්කරු එකඟ වූ පරිදි අළුත් මාළු, කරවල හෝ හරක් මස් සැපයීම වෙනුවට සඳුදා, අඟහරුවාදා, බදාදා, සෙනසුරාදා හා ඉරිදා දිනවල ටින් මාළු සපයා තිබුණි.

(v) ආහාර වේල් ප්‍රමාණයන් හා ආහාර වට්ටෝරු පිළිබඳ සැලකීමෙන් තොරව අවිධිමත් තාක්ෂණික ඇගයීම් කර තිබීම හේතුවෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වැඩිපුර ගෙවීම් ලෙස විශාල මුදල් ප්‍රමාණයක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

### 3.7.12 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

(අ) පරිවාස නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ පෞද්ගලික පාර්ශ්වයන් විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා තිබුණි. දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා රු.8,771,111 ක මුදලක් වැය කර තිබුණද, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා විධිමත් මුල්‍ය පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) උසාවි මගින් යොමු කෙරෙන ළමුන්, ඔවුන්ට ආරක්ෂාව සැලසීමේ අරමුණින් හා ඔවුන් යහපත් පුරවැසියන් වශයෙන් සමාජගත කිරීමේ අරමුණින් වෘත්තීය පුහුණුව හා පුනරුත්ථාපනය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ වන සහතික පාසැල් සඳහා යොමු කර තිබුණි. කෙසේ වුවද, යාපනය, සහතික පාසැලේ ආරක්ෂාව හා අධීක්ෂණය නොමැති වීම හේතුවෙන් ළමුන් 6 දෙනෙකු පලා ගොස් තිබුණි.

### 3.7.13 සමාජ සේවා දපාර්තමේන්තුව

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මහජන ආධාර මාසික දීමනා (PAMA) සම්බන්ධයෙන් අරමුදල් පාලනය පිළිබඳ නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(i) තැපැල් කාර්යාලවල ගෙවීම් සහතික කරන ලද ප්‍රකාශන පිළිබඳ අඩුපාඩු නොසලකා හැරීම.

(ii) තැපැල් කාර්යාලවල ගෙවීම් විස්තර තහවුරු කිරීමට නොහැකි වීම.

(iii) වාර්ෂිකව ඉල්ලුම්පත්‍ර ආකෘති නිකුත් කිරීමට නොහැකි වීම හා ඒ පිළිබඳ කටයුතු නොකිරීම.

(iv) තථ්‍ය ප්‍රතිලාභීන් නොවන පුද්ගලයන්ගේ අත්සන් නොසලකා හැරීම.

(v) තැපැල් කාර්යාලවලින් නොගෙවූ අරමුදල් හැකි ඉක්මනින් අයකර නොගැනීම.

**3.8 වත්කම් කළමනාකරණය**

**3.8.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂය තුළදී පළාත් සභාවේ වත්කම් පහත විශ්ලේෂණය කර ඇති පරිදි නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| | වත්කමේ ස්වභාවය | විස්තර | |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි | නිල නිවාස 85 | වටිනාකම ලබා ගත නොහැක. |
| (ආ) | වාහන | පික්අප් වාහන 04 | |
| | | යතුරු පැදි 10 | |
| (ඇ) | යන්ත්‍රෝපකරණ | ජෙනරේටර් 02 | |
| | | පරිගණක 53 | |
| | | පරිගණක උපාංග 226 | |
| (ඈ) | කාර්යාල උපකරණ | ප්ලාස්ටික් පුටු 107 | |
| | | ලී බඩු විෂයයන් 126 | |

**3.8.2 වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණය**

(අ) භෞතික පරීක්ෂණ / භාණ්ඩ සමීක්ෂණ මගින් තහවුරු නොවූ 2011 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද රු.332,822,052 ක් වූ වත්කම් පහත දැක්වේ.

| | | මුදල |
|---|---|---|
| | | රු. |
| (i) | කෘෂිකාර්මික ගොවිපලවල් | 113,256,440 |
| (ii) | පශු සම්පත් ගොවිපලවල් | 54,197,968 |
| (iii) | රෙදි කර්මාන්ත | 14,551,480 |
| (iv) | යන්ත්‍රෝපකරණ ඒකකය | 150,816,164 |
| | | 332,822,052 |

## 3.9 හඳුනා ගන්නා ලද පාඩු හා හානි

(අ) මන්නාරම නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට අයත් ගිලන් රථයක් 2003 දෙසැම්බර් 03 දින අනතුරකට පත්වී තිබුණි. එහි අළුත්වැඩියා පිරිවැය රු.695,700 ක් විය. වගකීම් පැවරීම සඳහා අනතුර සම්බන්ධයෙන් විමර්ශන පවත්වා නොතිබුණු අතර, පළාත් මුදල් රීති අංක 70 ප්‍රකාරව මෙම හානිය පිළිබඳ වාර්තා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරකට පත් වී තිබූ අතර, අළුත්වැඩියා පිරිවැය වූ රු.1,368,564 පෞද්ගලික ගරාජයකට ගෙවා තිබුණි. තවද, රු.1,036,344 ක මුදලක් පමණක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඉතිරි රු.332,220 පළාත් අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකීම පැවරීමට පළාත් මුදල් රීති 70 ප්‍රකාරව විමර්ශනයක් සිදු කර නොතිබුණි.

(ඇ) 1999 සිට 2011 කාලය තුළ සිදු වූ රු.56,418,312 ක් වූ හානි සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු 4 ක් විසින් පළාත් මුදල් රීති 70(5) ප්‍රකාර අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 17,554,713 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 22,794,842 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 13,142 |
| සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 9,644,965 |
| කර්මාන්ත දෙපාර්තමේන්තුව | 6,410,650 |

-------------
56,418,312
========

(ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, විශාල වත්කම් සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂය තුළ අස්ථානගත වූ බවට වාර්තා වී තිබුණි. එහෙත්, බොහොමයක් දෙපාර්තමේන්තු විසින් මෙම නැතිවීම් විසර්ජන ගිණුම්වල ඇතුළත් කර නොතිබුණු අතර, පළාත් මුදල් රීති 69 ප්‍රකාරව එම දෙපාර්තමේන්තු විසින් නැතිවීම් පිළිබඳ ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3.10 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, පළාත් සභාවල තිබුණු වාහන මුළු සංඛ්‍යාව 603 ක් වූ නමුත්, සේවයෙහි යෙදී සිටි රියැදුරන් සංඛ්‍යාව 400 ක් පමණක් විය. රියැදුරන්ගේ විශාල හිඟකම හේතුවෙන් දෙපාර්තමේන්තු කිහිපයක් සඳහා විවිධ සේවා සමූපකාර සමිතිවලින් රියැදුරන් බාහිරව යොදවා ගෙන තිබුණි.

(ආ) උතුරු පළාත් සභාවේ තිබූ ගිලන් රථ 85 කින් ගිලන් රථ 7 ක් අළුත්වැඩියා කිරීමෙන් තොරව වර්ෂ 4 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි. කෙසේ වුවද, එම වාහන අළුත්වැඩියා කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) වාහන ධාවන වාර්තා විධිමත්ව පවත්වා නොතිබුණු අතර, පළාත් මුදල් රීති අංක 432 ප්‍රකාරව රාජකාරී සඳහා බැහැර යාම් පිළිබඳව ධාවන වාර්තාවල සටහන් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තු කිහිපයක් විසින් සමාලෝචිත වර්ෂයේ එහි නිල වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන වාර්තා හා මාසික කාර්ය සාධන වාර්තා පළාත් මුදල් රීති 433 ප්‍රකාරව නියමිත දිනයන්හි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) මන්නාරම, වවුනියා, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් වාහන බොහොමයක් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් අළුත්වැඩියා සඳහා ගරාජවලට භාර දී තිබුණි.

(ඊ) පසුගිය වර්ෂවල ගිලන් රථ සම්බන්ධයෙන් වූ පාඩු පිළිබඳ දෙපාර්තමේන්තු ක්‍රියා මාර්ග 2012 දෙසැම්බර් දක්වා ගෙන නොතිබුණි.

## 3.11 ප්‍රසම්පාදන අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 4.2 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(ii) අනුමත ඇස්තමේන්තු සහ ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල සැඳහුම් දෙපාර්තමේන්තු කිහිපයක් විසින් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදනයන් සඳහා වූ වියදම් විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.5 වගන්තියට අනුව ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව තිදෙනෙකු විය යුතු වුවද, සාමාජිකයන් තිදෙනෙකුට වැඩි ප්‍රමාණයකට ගෙවීම් කර තිබුණි. ප්‍රසම්පාදන අත්පොතේ 2.9.1 වගන්තියට අනුව ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් කාර්යාල වේලාවෙන් බැහැරව සිදු කළ යුතු නමුත් සියළුම ප්‍රසම්පාදන කමිටු රැස්වීම් කාර්යාල වේලාව තුළ සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 164.1 වගන්තිය ප්‍රකාරව අනුමත සමිතිවල මූල්‍ය හා භෞතික හැකියාව ඇගයීම් කිරීමෙන් තොරව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම සමිතිවලට ඉදි කිරීම් වැඩ ප්‍රදානය කර තිබුණි.

(v) රු.9,100,000 කට ලැප්ටොප් පරිගණක 100 ක් මිලදී ගැනීම

අ.පො.ස. උසස් පෙළ විභාගය සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයින් අතර බෙදා දීම සඳහා ලැප්ටොප් පරිගණක 100 ක් රු.91,000 බැගින් ප්‍රසම්පාදනය කිරීමට පළාත් භාණ්ඩාගාරය විසින් රු.9,100,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) ඇණවුම් කරන ලද හා ලැබුණු විෂයයන් පිළිබඳ විස්තර සහ බෙදා හැරීම් ලැයිස්තු හා ප්‍රතිලාභීන්ගේ භාර ගැනීම් විගණන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලැප්ටොප් පරිගණක 100 ක් මිලදී ගැනීම පිළිබඳ අයවැය ප්‍රතිපාදන ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) විෂයයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා මුදල් පළාත් භාණ්ඩාගාරයේ ශීර්ෂ 421 වැය විෂය සංකේත 2302 මගින් ඇස්තමේන්තුවල ප්‍රතිපාදනය කර නොතිබුණද, මෙම වියදම පළාත් භාණ්ඩාගාරයේ ශීර්ෂ 421 ට අයකර තිබුණි.

(vi) රු.6,145,688 කට පෞද්ගලික ආයතනයක් (වීරසිංහම් ශාලාව) සඳහා වායු සමීකරණ සවි කිරීම

---

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.3 වගන්තිය ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වායු සමීකරණ 17 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. පසුව පළාත් භාණ්ඩාගාරය විසින් වායු සමීකරණ ප්‍රසම්පාදනය සඳහා ගෙවීම් යාපනය දිස්ත්‍රික් ලේකම් වෙත නිරවුල් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් භාණ්ඩාගාරයේ විෂය සීමාව යටතට නොගැනෙන පෞද්ගලික ආයතනයක් සඳහා රු.6,145,688 ක වටිනාකමට වායු සමීකරණ ප්‍රසම්පාදනය කිරීම සහ සවි කිරීම සිදු කර තිබුණි.

(ආ) වියදම සඳහා අයවැය ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඇ) පළාත් අරමුදල්වලින් විශාල ධාරිතාවයකින් යුත් වායු සමීකරණ 17 ක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය විගණන පරීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) විගණන පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී පෞද්ගලික ආයතනයට (වීරසංහම් ශාලාව) සවි කරන ලද වායු සමීකරණ එහි නොතිබුණි.

(vii) ට්‍රැක්ටර් ටිපර් ට්‍රේලර් 15 ක් හා බවුසර් 20 ක් රු.8,575,000 කට ප්‍රසම්පාදනය කිරීම

ප්‍රාදේශීය සභා මගින් නැවත පදිංචි කිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත විෂයයන් ප්‍රසම්පාදනය කිරීමට 2011 ජූලි 18 දින රු.8,575,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියදම දැරීම සඳහා අයවැය ඇස්තමේන්තුවේ මූලා‍ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) කාර්යයන් නැවත පදිංචි කිරීමේ කටයුතුවලට අදාල වුවද, ප්‍රසම්පාදනය කරන ලද විෂයයන් සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් මුදල් වැය කර තිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.14.1 වගන්තිය ප්‍රකාරව මිල සැඳහුම් 5 ක් අවම වශයෙන් ලබා ගත යුතු වුවද, මිල සැඳහුම් දෙකක් පමණක් ලබා ගෙන ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඈ) මිලදී ගත් විෂයයන් බෙදා හැරීම හා එම විෂයයන් භාරගත් බවට රිසිට්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(viii) නවීන වර්ගයේ ටොයෝටා මෝටර් රථයක් ප්‍රසම්පාදනය කිරීම - රු.9,950,000

නවීන වර්ගයේ ටොයෝටා මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා 2011 ජූනි 28 දින රු.9,950,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාල පාවිච්චිය සඳහා ඉහත මෝටර් රථය මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂ 400 වෙනුවට පළාත් භාණ්ඩාගාරයේ වැය ශීර්ෂ 421 යටතේ මෙම වියදම අයකර තිබුණි.

(ආ) වාර්ෂික ඇස්තමේන්තුවේ මේ සඳහා අයවැය ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි.

(ඇ) මිල සැඳහුම් 2 ක් පමණක් පදනම් කරගෙන ප්‍රසම්පාදන තීරණය ගෙන තිබූ බැවින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තියට පටහැනිව මිලදී ගැනීම සිදු කර තිබුණි.

(ඈ) මීට අමතරව ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යලයේ මෝටර් රථ 3 ක්, ජීප් රථ 5 ක් හා වෑන් රථයක් ඇතුළු වාහන 14 ක් තිබුණද, කිසිදු වලංගු හේතුවක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී නවීන වර්ගයේ මොටර් රථයක් ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඉ) 2003 ජුලි 24 දිනැති අංක 112 දරන ජාතික අයවැය චකුලේඛය පුකාරව මෙම වාහනය ප්‍රසම්පාදනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ix) පාපැදි 700 ක් මිලට ගැනීම - රු.8,859,500

---------------------------------------------

නැවත පදිංචි කරන ලද ජනතාව අතරේ බෙදා දීම සඳහා පාපැදි 700 ක් මිලදී ගැනීමට පළාත් භාණ්ඩාගාරය විසින් රු.8,859,500 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල අයවැය ප්‍රතිපාදන නොමැතිව පළාත් භාණ්ඩාගාරය විසින් පාපැදි මිලදී ගෙන තිබුණි.

(ආ) මිල සැඳහුම් 5 ක් වෙනුවට තුනක් පමණක් ලබාගෙන ප්‍රසම්පාදන තීරණ ගැනීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.14.1 වගන්තියට පටහනිව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඇ) පාපැදි විකුණුම් නොකරන බෙදුම්කරුවකු වූ සැපයුම්කරුට ගෙවීම් කර තිබුණි.

(ඈ) මුල් ඉන්වොයිස්පත් ලබා ගැනීමෙන් තොරව පාපැදි 200 ක් සඳහා රු.2,307,500 ක මුදලක් ගෙවා තිබුණි.

(ඉ) පාපැදි 700 කින් පාපැදි 479 ක් ආණ්ඩුකාරවරයා, ප්‍රාදේශීය කොමසාරිස්වරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ වෙනත් පාර්ශ්වයන් මගින් බෙදා දී තිබුණි. කෙසේ වුවද, ඉතිරි පාපැදි 221 බෙදා දීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර

නොතිබුණි. ප්‍රතිලාභීන් ලැයිස්තු සහ පාපැදි ලබා ගත් අයගෙන් භාර ගැනීම් පත්‍ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(x) බස් රථ 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.32,200,000

සමාලෝචිත වර්ෂය තුළ බස් රථ 10 ක් මිලදී ගැනීම සඳහා රු.32,200,000 ක මුදලක් ගෙවා තිබූ අතර, පළාත් භාණ්ඩාගාරය විසින් මෙම බස් රථ 10 උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට බෙදා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන නොමැතිව වියදම පළාත් භාණ්ඩාගාර ශීර්ෂ අංක 421 යටතේ අයකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට බස් රථ භාර දී තිබුණද, වර්ෂයක් ඉක්ම යාමෙන් පසුවත් බස්රථ වල අයිතිය උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සතුව තිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.14.1 වගන්තිය ප්‍රකාරව ලංසු 5 ක් වෙනුවට 2 ක් පමණක් පදනම් කරගෙන බස්රථ ප්‍රසම්පාදනය කිරීමේ තීරණය ගෙන තිබුණි.

(ඈ) 2003 ජූලි 24 දිනැති අංක 112 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව බස්රථ 10 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(xi) නිවාස ඉදි කිරීම් සඳහා ගෙවීම - රු.59,400,000

ඩෙල්ෆ්ට් හා පලාලි ප්‍රදේශවල නිවාස ඉදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.59,400,000 ක මුදලක් පලාලි ආරක්ෂක හමුදා මූලස්ථානයට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් භාණ්ඩාගාරයේ වාර්ෂික ඇස්තමේන්තුවල මේ සඳහා අයවැය ප්‍රතිපාදනයක් නොමැති වුවද, මෙම වියදම පළාත් මුදල් රීති අංක 47 ට පටහැනිව නව නිර්මිත

වැය විෂය සංකේත 3006 මගින් පළාත් භාණ්ඩාගාර වැය ශීර්ෂ 421 ට අය කර තිබුණි.

(ආ) එක් එක් නිවාසය ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු හා තථ්‍ය වියදම, ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව, නිවාස ඉදි කරන ලද ස්ථාන, නිම කිරීම් වාර්තා, ප්‍රතිලාභීන් ලැයිස්තු යනාදී විස්තර විගණන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) එම නිවාස ඉදි කිරීම සම්බන්ධයෙන් ගෙවීම් වවුචර් පළාත් මුදල් රීති අංක 107 ප්‍රකාරව සහතික කිරීමේ නිලධාරියෙකු මගින් සහතික කර නොතිබුණි.

(xii) ගැල්වනයිස් යකඩ සෙවිලි තහඩු ප්‍රසම්පාදනය කිරීම - රු.18,400,800

සමාලෝචිත වර්ෂය තුළ ජල ගැල්මෙන් බලපෑමට ලක්වූ ජනතාවගේ භාවිතය සඳහා ගැල්වනයිස් යකඩ සෙවිලි තහඩු මිලදී ගැනීමට පළාත් භාණ්ඩාගාරය විසින් රු.18,400,800 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්සණයන් කරනු ලැබේ.

(අ) අදාල පාර්ශවයන්ගේ ඉල්ලීම්, බලපෑමට ලක්වූ ජනතාවගේ ලැයිස්තු, ප්‍රතිලාභී ලැයිස්තු, ලබාගත් අයගෙන් ලැබීම්පත්, සෙවිලි තහඩු උපයෝජනය යනාදී විස්තර විගණන පරීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සපයන ලද යකඩ සෙවිලි තහඩුවල තත්ත්වය ඉතා බාල වර්ගයේ බවත්, එක් වරකට වඩා භාවිතා කළ නොහැකි බවත්, කල් නොපවතින බවත්, සෙවිලි තහඩු ලබා ගත් පුද්ගලයන් විසින් දන්වා තිබුණි.

(ඇ) මෙම මිලදී ගැනීම් කොළඹ සැපයුම්කරුවකුගෙන් මිලදී ගෙන තිබුණු නමුත්, එම සැපයුම්කරු යකඩ සෙවිලි තහඩු සපයන්නකු නොව ප්ලාස්ටික් අයිතම සහ විවිත්‍ර බඩු සපයන්නකු විය.

(ඇ) පළාත් සභාවේ නිලධාරීන් විසින් පිළියෙල කරනු වෙනුවට සැපයුම්කරු විසින් පිළියෙල කරන ලද භාණ්ඩ භාර ගැනීම් පත්‍රිකා (GRN) සමඟ සියළු ගෙවීම් සිදු කර තිබුණි.

(ඉ) මිලදී ගෙන බෙදා හරින ලද සෙවිලි තහඩු 24,300 කින් සෙවිලි තහඩු 12,350 ක් සඳහා පමණක් භාර ගැනීම් පත්‍රිකා ඉදිරිපත් කර තිබුණි.

(ඊ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.4 වගන්තියට පටහැනිව ප්‍රසම්පාදන කමිටුවට එක් සාමාජිකයකු පමණක් සහභාගී වී ප්‍රසම්පාදන ලියකියවිලිවල අත්සන් තබා තිබුණි.

(උ) සැපයුම්කරු විසින් කරන ලද ඉල්ලීමකින් තොරව ප්‍රවාහන ගාස්තු ලෙස රු.406,200 ක මුදලක් සැපයුම්කරුට ගෙවා තිබුණි. තවද, ප්‍රවාහන ගාස්තු ගෙවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවෙන් හෝ අදාල අධිකාරීන්ගෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සැපයුම්කරු ප්‍රවාහන ගාස්තු නොමැතිව එම විෂයයන් සැපයීමට එකඟ වී තිබූ බැවින් සෙවිලි තහඩු 5,000 ක පළමු තොගය ප්‍රවාහන ගාස්තු නොමැතිව සපයා තිබූ බව නිරීක්ෂණය විය. එහෙත්, සැපයුම්කරුගේ ඉල්ලීමක් නොමැතිව පසුව සැපයීම් සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවා තිබුණි. තවද, ප්‍රසම්පාදන කමිටුව ප්‍රවාහන ගාස්තු සම්බන්ධයෙන් කිසිදු සඳහනක් කර නොතිබුණි.

(ඌ) සැපයුම්කරු විසින් ලංසු ලියකියවිලිවල සම්මත මිමි (Gauge) සඳහන් කර නොතිබුණි.

(එ) ලංසු ලියකියවිලිවල නිල මුද්‍රාව තබා නොතිබුණි.

(ඒ) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, මෙම සෙවිලි තහඩු "සිලෝන් ගැල්වනයිස් ඉන්ඩස්ට්‍රීස්" වෙතින් ඉතා අඩු මුදලකට මිලදී ගෙන ඉතා වැඩි මිලකට පළාත් සභාවට විකුණා තිබුණි.

(xiii) නැවත පදිංචි කිරීමේ පවුල් සඳහා ජල ටැංකි 70 ක් (ලීටර් 1000) ප්‍රසම්පාදනය කිරීම - රු.894,000

---------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ජල ටැංකි 70 ක් මිලදී ගැනීම සඳහා රු.894,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාරෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදනය කිරීමෙන් තොරව පළාත් භාණ්ඩාගාරය යටතේ මෙම වියදම අයකර තිබුණි.

(ආ) කරච්චි ප්‍රාදේශීය සභාවට යැවීම සඳහා ජල ටැංකි 50 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, මෙම ජල ටැංකි 2012 දෙසැම්බර් 31 දක්වා ප්‍රාදේශීය සභාවට නිකුත් නොකර ගබඩාවේ නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි.

(xiv) 125 cc බජාජ් යතුරු පැදි 33 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.4,173,181

--------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ 125 cc බජාජ් යතුරු පැදි 33 ක් මිලදී ගැනීමට රු.4,173,181 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල අයවැය ප්‍රතිපාදන සැලසීමෙන් තොරව මෙම වියදම පළාත් භාණ්ඩාගාර වැය ශීර්ෂ 421 යටතේ අයකර තිබුණි.

(ආ) මිල සැඳහුම් 5 ක් වෙනුවට තුනක් පදනම් කරගෙන ප්‍රසම්පාදන තීරණය ගෙන තිබූ බැවින්, මෙම ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 වගන්තියට පටහැනිව සිදු කර තිබුණි.

(ඇ) කාර්යාල සහකරුවන් සඳහා යතුරු පැදි 33 ක් ප්‍රසම්පාදනය කිරීමට මහා භාණ්ඩාගාරයේ හා මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(xv) යාපනය දිස්ත්‍රික්කය සඳහා 8රැx6රැ ප්‍රමාණයේ දැන්වීම් පුවරු 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.865,000

2011 දෙසැම්බර් 16 දින යාපනය දිස්ත්‍රික්කය සඳහා 8රැx6රැ ප්‍රමාණයේ දැන්වීම් පුවරු 10 ක් සෑදීම සඳහා රු.865,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම වියදම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අය කරනු වෙනුව වැය ශීර්ෂ 430 පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අය කර තිබුණි.

(ආ) මිල සැඳහුම් 5 ක් වෙනුවට මිල සැඳහුම් තුනක් පමණක් පදනම් කරගෙන ප්‍රසම්පාදන තීරණ ගෙන තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තියට පටහැනිව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.8.3 වගන්තියට පටහැනිව තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඈ) යාපනයේ දැන්වීම් පුවරුවක පිරිවැය දළ වශයෙන් රු.26,000 ක් පමණ වේ. එහෙත්, යාපනයෙන් මිල සැඳහුම් ලබා ගෙන නොතිබුණි. කෙසේ වුවද, හෝකන්දර පෞද්ගලික සමාගමක් මගින් පුවරුවකට රු.86,500 බැගින් වූ රේටයකට දැන්වීම් පුවරු සපයා තිබුණු අතර, එම සමාගම උතුරු පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවකුද නොවීය. ඒ අනුව, දැන්වීම් පුවරු 10 ක් සඳහා රු.605,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2012 වර්ෂය තුළදීද එක් පුවරුවක පිරිවැය රු.86,500 බැගින් එම සැපයුම්කරුගෙන්ම දැන්වීම් පුවරු 57 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. එහෙත්, එම ගනුදෙනු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවීය.

(xvi) ජල පොම්ප 200 ක් උපාංග සහිතව ප්‍රසම්පාදනය කිරීම - රු.6,580,000

සමාලෝචිත වර්ෂය තුළදී $සොලෙක්ස්" ජල පොම්ප 200 ක් උපාංග සහිතව මිලදී ගැනීම සඳහා රු.6,580,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීමෙන් තොරව මෙම වියදම වැය ශීර්ෂ අංක 430-3-2-2306(32) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අය කර තිබුණි.

(ආ) ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) එකතු කළ අගය මත බදු අංකයක් නොමැතිව සැපයුම්කරුට රු.705,000 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) ගෙවා තිබුණි.

(xvii) ටොප් ලැන්ඩ් හෙවි ඩියුටි ඩීසල් පොම්ප උපාංග සහිතව ප්‍රසම්පාදනය කිරීම - රු.4,775,000

---

සමාලෝචිත වර්ෂය තුළදී ටොප් ලැන්ඩ් හෙවි ඩියුටි" ඩීසල් පොම්ප 5 ක් උපාංග සහිතව මිලදී ගැනීම සඳහා රු.4,775,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීමෙන් තොරව ශීර්ෂ අංක 431-44-4-2303 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ මෙම වියදම අයකර තිබුණි.

(ආ) මිල සැඳහුම් 5 ක් වෙනුවට 2 ක් පමණක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන තීරණය ගෙන තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 2.14.1 වගන්තියට පටහැනිව මෙම ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඇ) ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකයක් නොමැතිව සැපයුම්කරුට රු.509,465 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) ගෙවා තිබුණි.

(xviii) පැඩී කොම්බයින් හාවස්ටර්ස්" (Paddy Combine Harvesters) (Model 4LZ-2-0) 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.15,300,000

සමාලෝචිත වර්ෂය තුළදී පැඩී කොම්බයින් හාවස්ටර්ස්" 10 ක් මිලදී ගැනීම සඳහා රු.15,300,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීමෙන් තොරව මෙම වියදම ශීර්ෂ අංක 431-44-4-2304 කෘෂිකර්ම පොර්තමේන්තුව යටතේ අයකර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන තීරණ, භාණ්ඩ ලැබීම් පත්‍රිකා, ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු වැනි උපයෝගී සාක්ෂි ගෙවීම් වවුචර් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(xix) 100 KVA ජෙනරේටරයක් ප්‍රසම්පාදනය කිරීම - රු.2,647,128

සමාලෝචිත වර්ෂය තුළදී යාපනයේ පළාත් සංචාරක නිවාසය හා නේවාසිකාගරය සඳහා 100 KVA ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා රු.2,647,128 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විධිමත් අධිකාරියක් නොමැතිව රු.2,373,624 ක් වූ වියදම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුම යටතේ අයකර තිබුණි.

(ii) අදාල ලියකියවිලි නොමැතිවීම හේතුවෙන් අධි ධාරිතාවයකින් (100 KVA) යුත් ජෙනරේටරයක් ප්‍රසම්පාදනය කිරීමේ සාධාරණත්වය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

## 3.12 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

(i) නෙකෝර්ඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රු.2,482,181 ක තීරක ගාස්තු ගෙවීම

රු.2,482,181 ක වියදම නෙකෝර්ඩ් ව්‍යාපෘතියට අදාල වුවද, වවුනියා මහා රෝහලේ සිවු මහල් බාහිර රෝගී අංශය (OPD) හා සායන සංකීර්ණය ඉදි කිරීම සඳහා තීරක ගාස්තු නෙකෝර්ඩ් ව්‍යාපෘති අරමුදල්වලට අය කරනු වෙනුවට උතුරු පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ii) පැරණි උද්‍යාන සංවර්ධනය පිළිබඳ වියදම - රු.10,857,486

යාපනයේ පැරණි උද්‍යානය සංවර්ධනය සඳහා රු.10,857,486 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීමෙන් තොරව ශීර්ෂ අංක 461-15-4-2201 පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මෙම වියදම අය කර තිබුණි.

(ආ) කාර්යයන් හා ඉඩමේ අයිතිය යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වුවද, රු.මිලියන 10.8 පිරිවැයකට වූ වැඩ පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණු අතර, වියදම පළාත් අරමුදල්වලින් දරා තිබුණි.

(ඇ) මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.370,000 ක් වූ කළමනාකරණ ගාස්තු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අයකර තිබුණි.

(iii) ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) පාඨමාලා ගාස්තු ගෙවීම - රු.410,200

විධිමත් අනුමැතියකින් තොරව පුස්තකාල ගාස්තු රු.750 ක්ද ඇතුළත්ව ආචාර්ය උපාධි පාඨමාලා ගාස්තු ලෙස රු.410,200 ක මුදලක් වැඩ සටහන් සහකරුවන් 7 දෙනෙකුට සහ සමාජ සේවා නිලධාරින් 4 දෙනෙකුට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව උතුරු පළාත් සභාවේ පළාත් සැලසුම් ලේකම් කාර්යාලය හා සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ වියදම අයකර තිබුණි.

(ii) වැඩසටහන් සහකාරවරුන් සහ සමාජ සේවා නිලධාරින්ගේ සේවා ව්‍යවස්ථා අනුව එම තනතුරුවල ස්ථිර කිරීම සඳහා ආචාර්ය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් නොවේ.

(iv) තාවකාලික සාප්පු අයිතිකරුවන් සඳහා වන්දි ගෙවීම - රු.600,000

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට පටහැනිව පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.600,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී තාවකාලික සාප්පු අයිතිකරුවන් 6 දෙනෙකුට ගෙවා තිබුණි. තවද, ඉහත වියදම වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සැලසීමෙන් තොරව ශීර්ෂ අංක 471-60-4-1901 පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ අය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(v) නැවත සේවයේ නියුක්ත කරන ලද නිලධාරින්ට වැඩිපුර වැටුප් ගෙවීම - රු.3,360,959

2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවන ලද විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට රු.3,360,959 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(vi) ප්‍රාදේශීය රෝහල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය (MOH) ඉදි කිරීම සඳහා වැඩිපුර ඉඩම් ප්‍රමාණයක් අත්කර ගැනීම - රු. මිලියන 37.5

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2010 අගෝස්තු 07 දින මහජනයා විසින් පරිත්‍යාග කරන ලද අක්කර 05 ක ඉඩමක් දෙපාර්තමේන්තුව සතුව තිබියදී ඉඩම් අක්කර 15 ක් අත් කර ගැනීම සඳහා 2011 දෙසැම්බර් 31 දින පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රු. මිලියන 37.5 ක මුදලක් ගෙවා තිබුණි. ඉඩම අත්කර ගන්නා අවස්ථාවේදී ඉඩමේ වෙළඳපල වටිනාකම අක්කරයක් රු.200,000 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 7.5 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, ගෙවීම කිරීමට පෙර තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ඉදි කර තිබුණේ අක්කර 1 කට අඩු ප්‍රමාණයක ඉඩමක බව තවදුරටත් නිරීක්ෂණය විය.

(vii) අරමුදල් සාවද්‍ය පරිහරණය කිරීම - රු. මිලියන 2.887

ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ජල පොම්ප 570 ක් මිලදී ගැනීම් පිරිවැය මත 50% ක සහනදායී වටිනාකමට කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත නිකුත් කර තිබුණි. ජල පොම්ප 570 න් 264 ක් පමණක් ගොවීන් වෙත බෙදා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් 2011 අගෝස්තු 15 සිට 2011 සැප්තැම්බර් 12 දක්වා කාලය තුළ ගොවීන්ගෙන් රැස් කරන ලද රු. මිලියන 2.887 ක් රජයේ ගිණුමට ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ පෞද්ගලික බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික බැංකු ගිණුමේ තැන්පත් කරන ලද අරමුදල් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් සාවද්‍ය පරිහරණය කර තිබුණි.

(viii) චක්‍රලේඛ උපදෙස්

මුදල් රෙගුලාසි 756 සහ 2010 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයට පටහැනිව සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනා දක්වමින් පළාත් සභාව විසින් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි.

### 3.13 අරමුණු ඉටු කර ගැනීම

ආයතනික අරමුණු පහත දැක්වෙන පරිදි සම්පූර්ණයෙන් ඉටු කර නොගෙන හෝ ප්‍රමාණවත් ලෙස ඉටු කර නොගෙන තිබුණි.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ පළාත් රාජ්‍ය සේවයට සුදුසු පුද්ගලයන් බඳවා ගැනීමයි. සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකු විසින් බඳවා ගැනීම් යෝජනා ක්‍රම 41 ක් සකස් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සුදුසුකම් ඇති නිලධාරීන් බඳවා ගැනීමට යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.14 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(අ) උතුරු පළාතේ දේශීය මට්ටමින් පෝෂණ මැදිහත්වීම් ව්‍යාපෘතිය

මූලාා ප්‍රකාශන හා විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව කාල පරිච්ඡේදය සඳහා ලැබී තිබුණු රු.300,000,000 ක් වූ අරමුදල්වලින් ඉහත ව්‍යාපෘති කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.24,841,242 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) පළාත් මාර්ග ව්‍යාපෘතිය

(i) ව්‍යාපෘති ගිවිසුම අනුව, කිලෝමීටර් 100 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් මාර්ග ඉදි කිරීම් පැක්ජ 7 ක් රු. මිලියන 2,660 ක පිරිවැයකට සම්පූර්ණ කළ යුතු විය. කෙසේ වුවද, රු.මිලියන 1,515.4 කොන්ත්‍රාත් වටිනාකමකට මුළු දිග ප්‍රමාණය කි.මී. 55 පමණක් දිග මාර්ග වැඩ පැකේජ 4 ක් ව්‍යාපෘති කාර්යාලය විසින් ආරම්භ කර තිබුණු අතර, කිලෝමීටර් 45 ක් දිග ප්‍රමාණයක් වූ අනෙකුත් පැකේජ 3 හි කොන්ත්‍රාත් වැඩ මූලාා ගිවිසුමට එළඹී මාස 8 ක කාලයක් ඉකුත් වී තිබුණද, කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර නොතිබුණි. ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල මුළු වටිනාකම රු. මිලියන 1,697.2 (වැට් සහිතව) ක් වූ බැවින්, අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා ඉතිරි කිලෝමීටර් 45 සඳහා ප්‍රසම්පාදනය කිරීමට නොහැකි වූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂ මා වෙත දන්වා තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම ලෙස රු.558,130,986 ක මුදලක් ලැබී තිබුණද, මෙම කාලය සඳහා දරන ලද වියදම ගිණුම් පොත් අනුව, රු.234,089,574 ක් පමණක් විය. එබැවින්, 2011 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ ශේෂය වූ රු.346,653,804 ක් ව්‍යාපෘති කටයුතු සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

## 3.15 පළාත් පාලන ආයතනවල කටයුතු පිළිබඳ අධීක්ෂණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේ 8 වෙනි උපලේඛනයේ 4.2 වගන්තියේ ඇතුළත් විධිවිධානවලට අනුව, පළාතේ පළාත් පාලන ආයතන පිළිබඳ අධීක්ෂණය පළාත් සභාවට පවරා තිබුණි. පළාත් පාලන ආයතන පිළිබඳ මූලාා ප්‍රකාශන විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු අදාල පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 න් පළාත් පාලන ආයතන 5 ක් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් 2012 මාර්තු 31 ට පෙර විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද, උතුරු පළාතේ පළාත් පාලන ආයතන 8 ක සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් 2012 ජූනි 30 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල අවසාන ගිණුම් පිළිබඳව ප්‍රකාශ කරන ලද තත්ත්වාගණනය නොකළ විගණන මතය හා තත්ත්වාගණනය කළ විගණන මතය පිළිබඳ අවස්ථා පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද ගිණුම් සංඛ්‍යාව | තත්ත්වාගණනය නොකළ විගණන මතය ප්‍රකාශ කරන ලද ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|
| යාපනය | 06 | 11 |
| මුලතිව් | - | 04 |
| කිලිනොච්චි | - | 03 |
| වවුනියා | - | 05 |
| මන්නාරම | 02 | 03 |
| | 08 | 26 |

(ඇ) පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ඵලදායී හා අර්ථවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ප්‍රධාන ලේකම් හෝ උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ටෙන්ඩර් පරිපාටිය, ප්‍රසම්පාදන කමිටු තීරණ ආදිය අනුගමනය කිරීමෙන් තොරව මාර්ග, වැසිකිළි , නල ළිං වැඩ සඳහා කොන්ත්‍රාත්තු ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රජා මධ්‍යස්ථානවලට ප්‍රදානය කර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ හා අත්පොතේ 3.9.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුත්තේ ප්‍රජා මධ්‍යස්ථානවලට නොව පළාත් පාලන අංශයේ සංවර්ධන කාර්යයන්වලට දායක වන ප්‍රජා සංවර්ධන සමිතිවලට (Community Development Societies) ය.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, පළාත් සභාවේ දිස්ත්‍රික්ක පහක 2011 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | හිඟ ආදායම |
|---|---|---|
| | | රු. |
| යාපනය | 14 | 280,605,191 |
| මුලතිව් | 03 | 13,569,969 |
| කිලිනොච්චි | 01 | 122,308 |
| වවුනියා | 05 | 55,543,101 |
| මන්නාරම | 05 | 10,398,585 |
| | 28 | 360,239,154 |

මේ සම්බන්ධයෙන් අදාල පළාත් පාලන ආයතන විසින් රු.360,239,154 ක් වූ හිඟ ආදායම රැස්කර ගැනීමට අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඊ) උසාවි දඩ හා මුද්දර ගාස්තු - රු.221,638,007

ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි උසාවි මගින් පනවන ලද දඩ හා දේපල පැවරීමේදී අය කරන ලද මුද්දර ගාස්තු කාලීනව ඉල්ලීම් නොකිරීම හේතුවෙන් පළාත් සභා හා වෙනත් අධිකාරීන් විසින් පළාත් පාලන

ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව රඳවාගෙන තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට අය කර නොගන්නා ලද උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | හිඟ මුද්දර ගාස්තු | හිඟ උසාවි දඩ |
|---|---|---|
| | රු. | රු. |
| යාපනය | 156,355,876 | 21,490,927 |
| මුලතිව් | - | 7,279,455 |
| කිලිනොච්චි | - | 10,248,787 |
| වවුනියා | 3,378,703 | 18,742,098 |
| මන්නාරම | 18,350 | 4,123,811 |
| | 159,752,929 | 61,885,078 |

(උ) රු.249,414,242 ක් වටිනාකම වූ පළාත් පාලන ආයතන 26 ක වත්කම් හා බැරකම් මුදල් රෙගුලාසි 102 හා 103 ප්‍රකාරව විධිමත් අධිකාරියක් ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී තාවකාලික ජර්නල් මගින් ලියා හැර තිබුණි.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය පිළිබඳ විස්තර | මුදල |
|---|---|---|
| | | රු. |
| යාපනය | නගර සභා 02 | 9,584,906 |
| | ප්‍රාදේශීය සභා 13 | 20,185,660 |
| මන්නාරම | නගර සභා 01 | 235,905 |
| | ප්‍රාදේශීය සභා 04 | 18,781,713 |
| කිලිනොච්චි | ප්‍රාදේශීය සභා 03 | 133,542,197 |
| මුලතිව් | ප්‍රාදේශීය සභා 03 | 69,083,861 |
| | | 249,414,242 |

(ඌ) පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු සාරාංශ කර පහත දැක්වේ.

(i) විවිධ රාජ්‍ය නොවන සංවිධානයන් (NGOs) ගෙන් විශේෂයෙන් සුනාමියෙන් පසුව පරිත්‍යාග හා තෑගි ලෙස ලැබුණු වත්කම් හා ඉන්වෙන්ටරි විෂයයන් විධිමත්ව ඉන්වෙන්ටරිගත කර නොතිබුණි.

(ii) පළාත් පාලන ආයතනවල මානව සම්පත් විශේෂයෙන් සුනාමියෙන් පසුව විවිධ ආයතන / රාජ්‍ය නොවන සංවිධාන විසින් විධිමත් අනුමැතියක් නොමැතිව උපයෝජනය කර තිබුණි.

(iii) පළාත් කොමසාරිස් විමර්ශන නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳව පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ අනවශ්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(v) පාලන ගිණුම්වල ශේෂ උපයෝගී ලේඛන හෝ වාර්තාවල දැක්වෙන ශේෂ සමඟ ගැලපී නොතිබුණි.

(vi) නිල වාහන උපයෝජනය කිරීමට හිමිකම් නොමැති පළාත් පාලන ආයතන කිහිපයක මන්ත්‍රීවරුන් නිල වාහන උපයෝජනය කර තිබුණි.

(vii) පළාත් පාලන ආයතන විසින් ස්වකීය කම්කරු බලකාය යොදා ගනිමින් ඉදි කිරීම් වැඩ ක්‍රියාත්මක කරවා තිබුණි. කෙසේ වුවද, විධිමත් කාර්ය පත්‍රිකා පිළියෙල කර නොතිබුණි. එබැවින්, ඉන්වෙන්ටරි පාලනයක් හෝ තොග පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් තොග තත්ත්වය පරීක්ෂා කිරීමට හෝ තොග ඌනතා / අතිරික්ත නිශ්චය කිරීමට නොහැකි විය.

(viii) ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ බැවින් පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි තථ්‍ය වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ix) විවිධ පාර්ශ්ව විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතනවල වත්කම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(x) වර්ෂ 25 කට වැඩි කාලයක් දේපල තක්සේරුවක් කර නොතිබීම හේතුවෙන් වපරිපනම් හා බදු ආදායම වැඩි කිරීමට නොහැකි වී තිබුණි.

(xi) උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් සභාව සතු ඉඩම් කිහිපයක් බස් නැවතුම්පොළවල් සඳහා යොදා ගෙන තිබුණද, උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයෙන් කිසිදු අය කිරීමක් සිදු කර නොතිබුණි.

(xii) යාපනය මහ නගර සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලයට වැඩියෙන් පත් කිරීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් රු.7,605,420 ක මුදලක් වැටුප් ලෙස හා රු.2,835,000 ක් ජීවනාධාර දීමනා ලෙස අනුමත නොවූ කාර්ය මණ්ඩලය සඳහා ගෙවා තිබුණි.

(xiii) පළාත් පාලන සේවාවන් විසින් කරන ලද විශ්‍රාම දායකයන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට ප්‍රේෂණය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් යාපනය මහ නගර සභාව විසින් 2011 දෙසැම්බර් 31 දිනට රු.109,000 ක මුදලක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට ගෙවිය යුතුව තිබුණි.

## 4. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය පළාත් මුදල් රීති 99 ප්‍රකාරව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණනය කර නොතිබුණි.

(ආ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමේදී පළාත් මුදල් රීති 101 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගෙන නොතිබුණි.

(ඇ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද කරුණු කිහිපයක් සම්බන්ධයෙන් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අර්ථවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2000 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තු කිහිපයක විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5 පද්ධති හා පාලන

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් හා පාර්ශ්මික ගෙවීම, වත්කම් ප්‍රසම්පාදනය කිරීම, ගිණුම් පරිපාටිය, ගිණුම් වාර්තා පවත්වා ගැනීම, වත්කම් උපයෝජනය කිරීම ආදී කටයුතුවල නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ සැලකීමේදී පළාත් සභාවේ පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ

ආර්ථික බව හා ඵලදායී බව තහවුරු කර ගැනීමට ක්‍රියාත්මක වන පද්ධති හා පාලන ප්‍රමාණවත් නොවීය. එම ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුය.